**මහ කොළඹ ජලය හා අපජලය කළමනාකරණය වැඩිදියුණු කිරීම සඳහා ආයෝජන වැඩසටහන - 3 කොටස - 2017**

---

මහ කොළඹ ජලය හා අපජලය කළමනාකරණය වැඩිදියුණු කිරීම සඳහා ආයෝජන වැඩසටහනේ - 3 ව්‍යාපෘතියේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් පළමු ගිණුම් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රීලංර) සහ ආසියානු සංවර්ධන බැංකුව (ආසබැ) අතර 2016 අගෝස්තු 11 දින එළඹි අංක 3349-එස්ආර්අයි (එස්එෆ්) දරන ණය ගිවිසුමේ IV ව්‍යවස්ථාවේ 4.03 වගන්තිය සහ අංක 3348 දරන ණය ගිවිසුමේ IV ව්‍යවස්ථාවේ 4.05 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

මහ කොළඹ ජලය හා අපජලය කළමනාකරණය වැඩිදියුණු කිරීම සඳහා ආයෝජන වැඩසටහනේ - 3 ව්‍යාපෘතියේ ණය ගිවිසුම් අනුව එවකට පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය වර්තමානයේ පළාත් සභා, පළාත් පාලන හා ක්‍රීඩා අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන කොළඹ මහනගර සභාව ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. මහ කොළඹ ප්‍රදේශයේ ජල සම්පාදන හා අපජලය සේවා පිළිබඳ කාර්යක්ෂමතාවය හා මූල්‍ය තිරසාරත්වය වැඩිදියුණු කිරීම වැඩසටහනේ අරමුණ වේ. ණය ගිවිසුම් අනුව, වැඩසටහනේ මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 29,642.60 කට සමාන එජඩො මිලියන 228.02 ක් වූ අතර ඉන් රු.මිලියන 15,990 කට සමාන එජඩො මිලියන 120 ක් ආසියානු සංවර්ධන බැංකුවේ සාමාන්‍ය ප්‍රාග්ධන සම්පත් මගින් මූල්‍යායනය කිරීම සඳහාද රු.මිලියන 650 කට සමාන එජඩො මිලියන 5 ක් ආසියානු සංවර්ධන අරමුදලෙන් විශේෂ අරමුදල් සම්පත් මගින් මූල්‍යායනය කිරීම සඳහාද රු.මිලියන 6,500 කට සමාන එජඩො මිලියන 50 ක් යුරෝපීයන් ඉන්වෙස්ට්මන් බැන්ක් මගින්ද මූල්‍යානය කිරීමට එකඟ වී තිබුණි. ඉතිරි මුදල වන රු.මිලියන 6,502.60 කට සමාන එජඩො මිලියන 50.02 ක් ශ්‍රී ලංකා රජයේ දායකයෙන් අපේක්ෂා කර තිබුණි. තවද වැඩසටහනේ මුළු ඇස්තමේන්තුගත පිරිවැයෙන් රු.මිලියන 22,410.70 කට සමාන එජඩො මිලියන 172.39 ක් කොළඹ මහ නගර සභාව මගින් සිදු කිරීමට අපේක්ෂිත වැඩසටහනේ කාර්යයන් සඳහා වෙන් කර තිබූ අතර රු.මිලියන 7,231.90 කට සමාන එජඩො මිලියන 55.63 ක් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් සිදු කිරීමට අපේක්ෂිත වැඩසටහනේ කාර්යයන් සඳහා වෙන්කර තිබුණි. කොළඹ මහ නගර සභාව විසින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහනේ කාර්යයන් පිළිබඳ නිරීක්ෂණයන්ගෙන් මෙම වාර්තාව සමන්විත වේ. වැඩසටහන එහි කාර්යයන් 2016 නොවැම්බර් 03 දින ආරම්භ කරන ලද අතර 2020 ජුනි 30 දින වන විට නිම කිරීමට නියමිතය.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පටිපාටි ක්‍රියාත්මක කිරීම

විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පටිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්වය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් වැඩසටහනේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල වැඩසටහනේ කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ වැඩසටහනේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරුවනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) වැඩසටහනේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති වියදම් වැඩසටහන විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජය හා ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද වැඩසටහනේ වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් වැඩසටහනේ ප්‍රගතිය, වැඩසටහනේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම් හඳුනාගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක සහ අවසාන ශේෂ සහ එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූරණය කිරීම් වැඩසටහන විසින් පවත්වා තිබුණු පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රීලංමබැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුම්වල දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඊ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ වැඩසටහනේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(උ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව,

(ඌ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(එ) ණය ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

**1.5 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් උද්ගතවන ගැලපීම් වලින් ඇතිවන බලපෑම හැරුණු විට, මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වැඩසටහන නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2017 දෙසැම්බර් 31 දිනට වැඩසටහනේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ සහ එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූරණය කිරීම් වැඩසටහන විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රී ලං ම බැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව.

(ඈ) ණය ගිවිසුම්වල නියම කර ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව, සහ

(ඉ) ණය ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කිරුලපන පොම්පාගාරය ඉදිකිරීමේ කටයුතු හේතුවෙන් බලපෑම් වූ පවුල්වලට වන්දි ගෙවීම සඳහා වෙන්කල රු.මිලියන 10.50 ක මුදලින්, 2017 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතුව තිබූ එකතුව රු.මිලියන 1.00 ක් වූ වන්දි මුදල් මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කර නොතිබුණි.

(ආ) කිරුලපන ඉඩම් කට්ටි පවරා ගැනීම වෙනුවෙන් නාගරික සංවර්ධන අධිකාරියට ගෙවන ලද රු.මිලියන 17.77 ක අත්තිකාරම් මුදල මූල්‍ය ප්‍රකාශනවල වැරදි සහගත ලෙස ජංගම නොවන වත්කම් යටතේ දක්වා තිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්ය සාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය හා 2017 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනයට අදාළ වැදගත් සංඛ්‍යාලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුම්වලට අනුව මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | කොළඹ මහනගර සභාව මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන් කිරීම | 2017 දෙසැම්බර් 31 දිනට අරමුදල් උපයෝජනය | |
|---|---|---|---|---|---|---|---|
| | එජඩො මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන |
| ආ ස බැ | - | - | - | - | - | - | - |
| ඕසීආර් | 123.00 | 15,990.00 | 87.67 | 11,397.10 | 880.00 | 3.76 | 576.75 |
| එස්එෆ්ආර් | 5.00 | 650.00 | 5.00 | 650.00 | | | |
| ඊඅයිබී | 50.00 | 6,500.00 | 50.00 | 6,500.00 | 1,000.00 | - | - |
| ශ්‍රී ලං ර | 50.02 | 6,502.60 | 29.72 | 3,842.80 | 371.27 | 1.34 | 205.31 |
| | 228.02 | 29,642.60 | 172.39 | 22,389.90 | 2,251.27 | 5.10 | 782.06 |

### 3.2 භෞතික ප්‍රගතිය

ලද තොරතුරු අනුව, වැඩසටහනේ ක්‍රියාකාරකම් ප්‍රධාන සංරචක 03 ක් යටතේ ක්‍රියාත්මක කර තිබූ අතර ඒවා නම්, කොළඹ නගරයේ දකුණු පෝෂක ප්‍රදේශය තුළ අප ජල පද්ධතිය ප්‍රතිසංස්කරණය හා පුළුල් කිරීම, දකුණු පෝෂක ප්‍රදේශයේ අපජල පිරියම් කිරීමේ පිරියතය ඉදිකිරීම සහ ආයතන ව්‍යුහය හා සේවා සැපයුම් කරුවන්ගේ ධාරිතාව ශක්තිමත් කිරීම වේ. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) නව ගුරුත්ව අපජලාපවහන කාණු ඉදිකිරීම, ෆෝස්මේන් (force main) සහ කිරුළපන පෝෂක ප්‍රදේශයේ පොම්පාගාරය ඉදිකිරීම සඳහා ලංසු කැඳවීම 2015 ඔක්තෝබර් 28 දින සිදුකර තිබූ අතර ඒ සඳහා 2016 ජූලි 28 දින ණය ලබාදෙනු ලබන නියෝජිතායතනයේ එකඟතාවය ලැබී තිබුණි. කෙසේ වුවද, අදාල එකඟතාවය ලැබීමෙන් මාස 10 ක පමාවීමකින් පසු 2017 මැයි 04 වන දින ඇස්තමේන්තු අගය රු.මිලියන 7,015.91 කට කොන්ත්‍රාත්තුව විදේශ සමාගමකට ප්‍රදානය කර තිබුණි. තවද, 2017 දෙසැම්බර් 31 දිනට කොන්ත්‍රාත්තුවේ කාර්යයන්ගේ ඉදිකිරීම් ඉලක්කය සියයට 9.80 ක් වුවද, සත්‍ය භෞතික ප්‍රගතිය සියයට 2.58 ක් පමණක් ලෙස දැක්වුණි.

(ආ) කිරුළපන - නාරාහේන්පිට අපජල කාණු පද්ධතිය ඉදිකිරීමේ කටයුතු සඳහා ඉඩම් අත්පත් කර ගැනීමේ මතභේද නිසා එහි ඉදිකිරීම් කටයුතු 2017 දෙසැම්බර් 31 දින වන විටත් ආරම්භ වී නොතිබුණි.